# An English Course – Lesson 2

## Vowels – ස්වර අක්ෂර

ඉංග්‍රීසි භාෂාවෙහි ස්වර 12 කි. ඒවායින් 7 ක් short vowels සහ 5 ක් long vowels වේ. මෙහි phonetic script ලෙස හදුන්වන්නේ oxford dictionary යෙහි යොදාගත ඇති ඉංග්‍රීසි භාෂා උච්චාරනය පිලිබද සංකේත වේ.

| **සිංහලෙන්** | **example** |
|---|---|
| අ | Alone |
| අ | Up |
| ඇ | At |
| ඉ | In |
| උ | Put |
| එ | Egg |
| ඔ | On |
| | |
| අ | Nurse |
| ආ | Art |
| ඊ | Easy |
| ඌ | Moon |
| ඕ | All |
| | |

අ සහ ඒ ඉංග්‍රීසියේ ස්වර ශබ්ද නොවේ. ඝෝෂයකට පෙර ඇ මදක් කෙටිවේ.

සිංහලයේදී මෙන් නොව ඉංග්‍රීසියේ ස්වර සංඛ්‍යාව හා ශබ්ද මදක් වෙනස් වන බව සලකන්න.

## ද්විස්වර

ඉංග්‍රීසි භාෂාවේ ස්වර දෙකක් මගින් හටගන්නා ශබ්ද ද්විස්වර (diphthongs) වේ. සිංහල බසෙහි **අඉ යන්න එකට ගත් විට** ඓ ලෙසද **අඋ යන්න එකට ගත්විට ඖ** යන්නද ලැබෙන්නාක් මෙන් ද්විස්වර මැද හිස්තැන් නොතබා උච්චාරණය කල යුතුයි. නූතන ඉංග්‍රීසියෙහි ප්‍රධාන ද්විස්වර වර්ග 8 කි. ඒවා පහත ආකාර වේ.

| | සිංහලෙන් | example |
|---|---|---|
| 1 | ඔඉ | Oil |
| 2 | අඉ | Eye |
| 3 | එඉ | Eight |
| 4 | උඅ | Poor |
| 5 | ඉඅ | Ear |
| 6 | එඅ | Wear |
| 7 | අඋ | Out |
| 8 | අඋ | Saw |

ඉංග්‍රීසි ඉගෙනුමේදී උච්චාරණය පිළිබද ඉතාමත් සැලකිලිමත් විය යුතුයි. bad යන වචනය සහ lady යන වචනය සලකන්න. මෙහිදී bad යන්නෙහි vowel එකක් ඇති අතර lady යන්නෙහි diphthong එකක් ඇත. මෙසේ පාඩමක් සකස් කිරීමට හේතුව උ උච්චාරණය පිළිබද යමක් ලබාදීමටය.

## ද්විස්වර අක්ෂර සංයෝග සහ ත්‍රී ස්වර අක්ෂර සංයෝග

ස්වර අක්ෂර දෙකක් එකතු වි සැදෙන සංයෝග ද්විස්වර අක්ෂර සංයෝග වන අතර ස්වර අක්ෂර තුනක් එකතු වි සැදෙන සංයෝග ත්‍රීස්වර අක්ෂර සංයෝග වේ.

ඉංග්‍රීසියේදී ද්වි ස්වර අක්ෂර සංයෝග 29 කි.

aa ae ai au aw ay ea ee ei eo eu ew
ey ia ie io oa oe oi oo ou ow oy ua
ue ui uo uy

තවද ඉංග්‍රීසියේ ත්‍රීස්වර අක්ෂර සංයෝග 17 ක් පවතී. වාක්‍ය සහ ව්‍යාකරණ වලට යාමට පෙර ඒවාද දැනගැනීම වැදගත්වේ.

eye eau eou ewe eye ieu iow iou oeu owe uai uaw
uay uea uee uoy

ත්‍රී ස්වර ශබ්ද දෙකක් පවතී

අඋඅ සඳහා උදාහරණය our වන අතර අඉඅ සඳහා උදාහරණය fire වේ.

**All rights received © 2007 Edulanka.com.**  **edulanka@gmail.com**

**ව්‍යංජන**

ඉංග්‍රීසියේ ව්‍යංජන ශබ්ද 24ක් පවතී.

මෙම පාඩමින් ඉදිරිපත් කලේ ඉංග්‍රීසියෙහි ඇති ශබ්ද පිලිබදවයි. ඉදිරි පාඩම්වලින් ඉංග්‍රීසි තනිව ඉගෙනුමට වැඩි තොරතුරු ලබාදෙනු ඇත.

www.edulanka.com
edulanka@gmail.com